**මුදල් මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

| **2021 ජුනි 09** | **චක්‍රලේඛය** | **2021 අංක 06** |
|---|---|---|

## කොවිඩ්-19 නිසා බලපෑමට ලක් වූ ව්‍යාපාර හා පුද්ගලයන් සඳහා සහන සැලසීම

කොවිඩ්-19 වසංගතයේ තෙවන ව්‍යාප්තිය හමුවේ පීඩාවට පත් ණය ගැනුම්කරුවන්/පාරිභෝගිකයන්ට සහන සැලසීම සම්බන්ධව රාජ්‍ය ආයතන සහ අනෙකුත් පාර්ශව රැසක් ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ඉල්ලීම් කර ඇත. ඒ අනුව, කොවිඩ්-19 වසංගතයේ තෙවන ව්‍යාප්තිය නිසා ව්‍යාපාර හා පුද්ගලයින් විසින් මුහුණපා ඇති ගැටළු සලකා බලමින්, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් (මින් ඉදිරියට බැංකු නොවන මූල්‍ය ආයතන ලෙස හැඳින්වෙන) විසින් බලපෑමට ලක්ව ඇති ව්‍යාපාර හා පුද්ගලයන් වෙත ලබා දී ඇති ණය සහන යෝජනා ක්‍රමය (මින් ඉදිරියට යෝජනා ක්‍රමය ලෙස හැඳින්වෙන) යටතේ තවදුරටත් පහත සහනයන් ලබා දීමට කටයුතු කරන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු නොවන මූල්‍ය ආයතන වෙතින් ඉල්ලා සිටී. කොවිඩ්-19 ව්‍යාප්තිය හේතුවෙන් පීඩාවට පත් වූ ව්‍යාපාර හා පුද්ගලයන්ගේ ඉල්ලීම පරිදි, මෙම චක්‍රලේඛය යටතේ ලබා දී ඇති සමස්ත ප්‍රතිලාභ අඩු නොවන අයුරින් අමතර සහන සැලසීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන හට හැකියාව ඇත. මෙම යෝජනා ක්‍රමය සියලු බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ඒකාකාරී ලෙස ක්‍රියාත්මක කරවීම සඳහා සහ ව්‍යාපාර හා ආදායම් ඉපයීමේ කටයුතු වල සිදුව ඇති ඇනහිටීම් හේතුවෙන් ණය ගැනුම්කරුවන් හට ණය වාරික ආපසු ගෙවීමේ දී ඇතිවන පීඩාව ලිහිල් කිරීමේ අරමුණින් මෙම චක්‍රලේඛය නිකුත් කර ඇත.

### 1. 2021 මැයි 15 දින වන විට සක්‍රීයව පැවති ණය පහසුකම් කල් දැමීම සහ ප්‍රතිව්‍යුහගත කිරීම

(අ) සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන් මුහුණ දී ඇති මූල්‍ය දුෂ්කරතා, එනම් රැකියා අහිමිවීම, ආදායම් අහිමිවීම හෝ ආදායම/වැටුප් අඩු වීම හෝ විකුණුම් අඩු වීම, ව්‍යාපාර වසා දැමීම යනාදිය සලකා බලා කොවිඩ්-19 තෙවන රැල්ලෙන් පීඩාවට පත් වූ ණය ගනුදෙනුකරුවන්ගේ දැනට පවතින ණය පහසුකම් වල මුල් ණය මුදල හෝ පොලිය හෝ එම කොටස් දෙකම හෝ 2021 අගෝස්තු 31 දක්වා කාලය තුළ එක් එක් අවස්ථාව අනුව අය කර ගැනීම කල් දැමීමට බැංකු නොවන මූල්‍ය ආයතන විසින් කටයුතු කළ යුතුය.

(ආ) සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන්ට ලබා දී ඇති ණය පහසුකම් එකක් හෝ ඊට වැඩි ගණනක මුල් ණය මුදල හෝ පොලිය හෝ ඒ දෙකම ගෙවීම කල් දැමීම, එම ගනුදෙනුකරුවන්

විසින් මුහුණපා ඇති මූල්‍ය දුෂ්කරතා සහ ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ හැකියාව සැලකිල්ලට ගනිමින් සිදු කළ යුතුය.

(ඈ) බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ඉහත කල් දමන ලද කාලසීමාව සඳහා සහ කල්දමන ලද මුදල මත පමණක් 2021 මැයි 19 දින පැවති දින-364 භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසි අනුපාතයට සියයට 5.5 ක් (එනම් වසරකට 10.68%) එකතු කළ අගය නොඉක්මවන වාර්ෂික පොලී අනුපාතයක් අය කළ හැකියාව ඇත.

(ඇ) විකල්පයක් ලෙස, ණය ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ හැකියාව සහ පිළිගත හැකි ව්‍යාපාර නඟා සිටුවීමේ සැලැස්මක් (Revival Plan) ඉදිරිපත් කිරීම සැලකිල්ලට ගනිමින්, දැනට පවතින ණය පහසුකම් දීර්ඝ කාලයක් සඳහා ප්‍රතිව්‍යුහගත කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන වලට හැකියාව පවතින අතර මෙහිදී බැංකු නොවන මූල්‍ය ආයතන සහ ණය ගැනුම්කරු විසින් දැනට පවතින අඩු පොලී අනුපාතයන් සැලකිල්ලට ගනිමින් සුදුසු අඩු පොලී අනුපාතයකට එකඟ විය යුතුය.

(ඉ) ණය සහන කාලය තුළ එනම් 2021 මැයි 15 සිට 2021 අගෝස්තු 31 දක්වා දඩ පොලිය එකතු කිරීමක් හෝ අය කිරීමක් සිදු නොකළ යුතුය.

(ඊ) දැනට පවතින සංචරණ සීමා හේතුවෙන් බලපෑමට පත් ගනුදෙනුකරුවන් විසින් ණය ආපසු ගෙවීමේ නියමිත දිනය, දින කිහිපයකින් (උපරිම වැඩ කරන දින 10 ක් දක්වා) කල් දැමීමට කරන ඕනෑම ඉල්ලීමක් සඳහා ණය පහසුකම් කල් දැමීමක් හෝ ප්‍රතිව්‍යුහගත කිරීමක් ලෙස සැලකීමෙන් තොරව අවස්ථාව ලබා දිය යුතු අතර, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ගනුදෙනුකරුවන්ගේ එවැනි ප්‍රමාදයන් සඳහා කිසිදු අමතර පොලියක් හෝ වෙනත් ගාස්තු අය නොකළ යුතුය.

(උ) 2021 මාර්තු 12 දින නිකුත් කරන ලද 2021 අංක 04 දරන චක්‍රලේඛය යටතේ කල්බදු මූල්‍යකරණ පහසුකම් ආපසු ගෙවීම් කල් දැමීමේ සහන භුක්ති විඳින හෝ 2021 මාර්තු 19 දින නිකුත් කරන ලද 2021 අංක 05 දරන චක්‍රලේඛය යටතේ ණය සහන ලබා ගත් ණය ගනුදෙනුකරුවන් ඉහත සහන සඳහා සුදුසුකම් නොලබනු ඇත.

**මුදල් මණ්ඩලය**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

**2021 ජුනි 09** **චක්‍රලේඛය** **2021 අංක 06**

**2. 2021 මැයි 15 දිනට අක්‍රීය කාණ්ඩයේ පැවති ණය පහසුකම් සඳහා හිමිවන සහන**

(අ) ණය ලබා ගත තැනැත්තාගේ ආපසු ගෙවීමේ හැකියාව සහ පිළිගත හැකි ව්‍යාපාර නඟා සිටුවීමේ සැලැස්මක් ඉදිරිපත් කිරීම සැලකිල්ලට ගනිමින් 2021 මැයි 15 දින වන විට අක්‍රීය තත්ත්වයේ පවතින ණය පහසුකම්, දීර්ඝ කාලයක් සඳහා ප්‍රතිලේඛනගත කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන වෙත හැකියාව පවතින අතර මෙහිදී, පොලී අනුපාත ඇතුළු නියමයන් හා කොන්දේසි සම්බන්ධව බැංකු නොවන මූල්‍ය ආයතනය සහ ණය ගැනුම්කරු එකඟතාවයකට පැමිණිය යුතු වේ.

(ආ) 2 (අ) හි සඳහන් කර ඇති පරිදි, මෙම යෝජනා ක්‍රමය යටතේ ප්‍රතිලේඛනගත කිරීම සඳහා සලකනු ලබන පහසුකම් සඳහා 2020 අප්‍රේල් 01 දින සිට 2021 මැයි 15 දින දක්වා කාලය තුළ එකතු කර ඇති හෝ අය කර ඇති දඩ පොලී කපා හැරීමට බැංකු නොවන මූල්‍ය ආයතන කටයුතු කළ යුතුය.

(ඇ) මෙම චක්‍රලේඛය යටතේ සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන්ගේ 2020 අප්‍රේල් 01 දින හෝ ඊට පසුව අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර ඇති ණය පහසුකම් වලට අදාලව සියලුම අත්පත් කර ගැනීමේ ක්‍රියාමාර්ග 2021 අගෝස්තු 31 දක්වා අත්හිටු වීමට බැංකු නොවන මූල්‍ය ආයතන විසින් කටයුතු කළ යුතුය.

(ඈ) බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය සහන ලබා දීමේ දී අධික ගාස්තු හෝ අය කිරීම් එකතු නොකළ යුතුය.

**3.** පැහැදිලිවම පීඩාවට පත් වූ ගනුදෙනුකරුවන් සඳහා 2021 ජුනි 30 දක්වා කාල සීමාව තුළ, ණය කාඩ්පත් සහ වෙනත් ණය පහසුකම් සඳහා ප්‍රමාද ගාස්තු අය කිරීම අත්හිටුවීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන කටයුතු කළ යුතුය.

**4.** පවත්නා ණය පහසුකම/පහසුකම් කල් දැමීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම වෙනුවට ණය ගනුදෙනුකරු විසින් ඔහුගේ/ඇයගේ පවත්නා ණය පහසුකම් 2021 අගෝස්තු 31 දින හෝ ඊට පෙර පියවා අවසන් කිරීමට ඉල්ලා සිටී නම් එවැනි පහසුකම් සඳහා කිසිදු පූර්ව පියවීමේ ගාස්තුවක් අය කිරීමෙන් වැලකී සිටීමට බැංකු නොවන මූල්‍ය ආයතන කටයුතු කළ යුතුය.

## 5. ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB) වෙත වාර්තා කිරීම්

(අ) බැංකු නොවන මූල්‍ය ආයතන විසින් මෙම යෝජනා ක්‍රමය යටතේ සුදුසුකම් ලබන ණය ගනුදෙනුකරුවන්ගේ ණය අයදුම්පත්, හුදෙක් අසතුටුදායක ණය තොරතුරු වාර්තාවක් මත පමණක් පදනම්ව ප්‍රතික්ෂේප කිරීමෙන් වැළකිය යුතුය.

(ආ) මෙම යෝජනා ක්‍රමයට සහභාගී වීම ණය ගැනුම්කරුවන්ගේ ඉදිරි ණය තොරතුරු වාර්තා සහ අනාගත ණය ශ්‍රේණිගත කෙරෙහි බලපෑමක් ඇති නොවන ආකාරයෙන්, මෙම යෝජනා ක්‍රමය යටතේ ලබා දී ඇති ණය ආපසු ගෙවීම කල් දැමීම්/ ප්‍රතිව්‍යුහගත කිරීම් වාර්තා කිරීම සඳහා ක්‍රමවේදයක් බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය සමඟ සාකච්ඡා කර සකස් කළ යුතු වේ.

## 6. ඉල්ලුම්පත් ඉදිරිපත් කිරීමේ අවසාන දිනය

(අ) ඉහත ණය සහන සඳහා සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන් 2021 ජූලි 15 දිනට හෝ ඊට පෙර ලිඛිතව හෝ විද්‍යුත් මාර්ගයෙන් ඉල්ලීමක් කල යුතු අතර බැංකු නොවන මූල්‍ය ආයතන විසින් මෙම ණය සහනයන්, අයදුම් කළ යුතු අවසාන දිනය සහ අයදුම්පතේ ආකෘතිය මුද්‍රිත සහ/හෝ විද්‍යුත් මාධ්‍යයෙන් (විද්‍යුත් තැපැල් සහ කෙටි පණිවිඩ සේවා ඇතුලත්ව) සන්නිවේදනය කිරීමට කඩිනමින් කටයුතු කළ යුතුය.

(ආ) සාධාරණ හේතුවක් මත ණය සහන සඳහා ඉල්ලුම් කිරීම ප්‍රමාද වී ඇත්නම් පමණක්, 2021 ජූලි 15 දිනෙන් පසු ඉදිරිපත් කරන ඕනෑම ඉල්ලුම්පතක් බැංකු නොවන මූල්‍ය ආයතන විසින් පිළිගත යුතුය.

(ඇ) සුදුසුකම් ලද නමුත් ණය ආපසු ගෙවීමේ හැකියාව ඇති ණය ගනුදෙනුකරුවන් විසින් ණය පහසුකම් කල් දැමීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අයදුම් කිරීම වෙනුවට ණය ආපසු ගෙවීම සඳහා කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(ඈ) මෙම ණය සහන සඳහා අයදුම් කරනු ලබන ණය ගනුදෙනුකරුවන්ගේ ඉල්ලීම් අනුමත කිරීමට පෙර අදාළ ණය පහසුකම් කල් දැමීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීමේ ආකාරය පිළිබඳව දැනුවත් කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන කටයුතු කළ යුතු අතර, එවැනි ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීමේදී ද ඒ සඳහා හේතු පැහැදිලිව සඳහන් කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන කටයුතු කළ යුතුය.

**7. ණය සහන කාල සීමාව සම්බන්ධව ගිණුම් තැබීම**

බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය සහන කාල සීමාවට අදාළව ගිණුම් තැබීමේ දී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 දෙසැම්බර් 31 දින නිකුත් කරන ලද ලිපියේ අන්තර්ගත අතිරේක උපදෙස් අනුව කටයුතු කළ යුතුය. බැංකු නොවන මූල්‍ය ආයතන හට මේ සම්බන්ධව අමතර මඟපෙන්වීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් හෝ විගණකවරුන්ගෙන් විමසිය හැක.

**8. වාර්තාකරණ අවශ්‍යතා**

2021 ජුලි 30 දින සිට සෑම මසකම වැඩකරන දින 15 ක් තුළ දී බැංකු නොවන මූල්‍ය ආයතන විසින් එම ආයතන වලින් ණය සහන ලබාගෙන ඇති ගනුදෙනුකරුවන් පිලිබඳ තොරතුරු බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතුය. තොරතුරු ඉදිරිපත් කළ යුතු ආකෘතිය ඉදිරියේ දී යොමු කරනු ලැබේ.

අත්සන් කලේ,

**මහාචාර්ය ඩබ්. ඩී. ලක්ෂ්මන්**

මුදල් මණ්ඩලයේ සභාපති සහ

ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

## වැඩි විස්තර සඳහා කරුණාකර ඔබේ ළඟම ඇති ශාඛාව අමතන්න

**<u>අයිඩියල් ෆිනෑන්ස් - සම්බන්ධතා තොරතුරු</u>**

| ශාඛාවේ නම සහ ලිපිනය | ඇමතුම් විස්තර | ශාඛා කළමනාකරුගේ නම | ශාඛා කළමනාකරු සම්බන්ධතා තොරතුරු |
|---|---|---|---|
| අනුරාධපුර ශාඛාව<br>අංක: 09,<br>ප්‍රධාන වීදිය,<br>අනුරාධපුර | දු.ක.  : 025 2237925<br>ෆැක්ස් : 025 2237905 | අකිල ජයතිලක මහතා | ජංගම දුරකථන අංකය<br>0719923730 |
| බණ්ඩාරවෙල ශාඛාව<br>අංක: 339,<br>ජනහිත ගොඩනැගිල්ල,<br>ප්‍රධාන වීදිය,<br>බණ්ඩාරවෙල | දු.ක : 057 2221025<br>ෆැක්ස් : 057 2230030 | නිලංග ජයලත් මහතා | ජංගම දුරකථන අංකය<br>0718643335 |
| එල්පිටියා ශාඛාව<br>අංක 117,<br>ප්‍රධාන වීදිය,<br>ඇල්පිටිය. | දු.ක  : 091 2291427<br>ෆැක්ස් : 091 2291428 | ගයාන් මල්ලවරාච්චි මහතා | ජංගම දුරකථන අංකය<br>0714940022 |
| එම්බිලිපිටියා ශාඛාව<br>අංක: 28,<br>පල්ලෙගම පාර,<br>ඇඹිලිපිටිය | දු.ක : 047 2261467<br>ෆැක්ස්  : 047 2261468 | චින්තක සෙනෙවිරත්න මහතා | ජංගම දුරකථන අංකය :<br>0703564162 |
| ප්‍රධාන කාර්යාලය<br>අංක: 299,<br>යූනියන් පෙදෙස,<br>කොළඹ 02 | දු.ක : 011 2396060<br>ෆැක්ස් : 011 2396757 | චමත් ජයසිංහ මහතා | ජංගම දුරකථන අංකය :<br>0714940020 |
| යාපනය ශාඛාව<br>අංක: 408,<br>රෝහල් පාර,<br>යාපනය | දු.ක : 021 2219990<br>ෆැක්ස්  : 021 2219991 | කනගනාදන් සුගන්තන් මහතා | ජංගම දුරකථන අංකය:<br>0714940021 |
| මහනුවර ශාඛාව<br>අංක: 119 ඒ,<br>කොටුගොඩෙල්ලා වීඩියා,<br>මහනුවර | දු.ක  : 081 2208708<br>ෆැක්ස්  : 081 2208709 | සාලියා මාලුදේනියා මහතා | ජංගම දුරකථන අංකය:<br>0718875414 |
| කුරුණෑගල ශාඛාව<br>අංක 33,<br>සුරතීස්ස මාවත, කුරුණෑගල | දු.ක : 037 2232110<br>ෆැක්ස් : 037 2232010 | සමන් ධර්මසිරි මහතා | ජංගම දුරකථන අංකය<br>0714940027 |
| මාතර ශාඛාව<br>අංක: 91,<br>අනගරිකා ධර්මපාල එම්.<br>මාතර | දු.ක : 041 2226916<br>ෆැක්ස් : 041 2226912 | යසිතා නාඩුන් ගේබ්රියෙල් මහතා | ජංගම දුරකථන අංකය :<br>0703561472 |
| මොණරාගල ශාඛාව<br>අංක: 100,<br>නව බස් නැවතුම්පොළ,<br>මොණරාගල | දු.ක : 055 2055858<br>ෆැක්ස්: 055 2055588 | රසිකා බන්දර මහතා | ජංගම දුරකථන අංකය :<br>0719923732 |
| ගම්පහ ශාඛාව<br>අංක 03,<br>බෞද්ධෝකා මාවත, ගම්පහ | දු.ක : 033 2121321 / 033 2121421<br>ෆැක්ස් : | නිශාන්ත කන්නංගර මහතා | ජංගම දුරකථන අංකය :<br>0703561458 |